**<u>මීරිගම ප්‍රාදේශීය සභාව</u>**
**<u>ගම්පහ දිස්ත්‍රික්කය</u>**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 03 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූනි 29 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මීරිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ ණයහිමියන් අධි වෙන්කිරීම් සහ අවලංගු කරන ලද ව්‍යාපෘතිවලට අදාලව එකතුව රු.25,203,362 ක මුදල ණයහිමියන් ගෙන් ඉවත් කිරීමේදී ජ'නල් සටහන් 26 අනුව රු.43,349,700 ක් ලෙස ගෙන තිබීම නිසා රු.18,146,338 කින් ණයහිමි ගිණුම අඩුවෙන්ද සමුච්චිත අරමුදල් ගිණුම වැඩියෙන්ද දැක්වුණි.

(ආ) ඉහත අධි වෙන්කිරීම් සහ අවලංගු කරන ලද ව්‍යාපෘති මුදල් එකතුව වූ රු.25,203,362 ක මුදල ප්‍රාග්ධන ආධාර ගිණුමෙන් ඉවත්කිරිමේදී රු.43,349,700 ක් ලෙස ගිණුම් ගත කිරීම නිසා ලැබියයුතු ප්‍රාග්ධන ආධාර ගිණුම රු.18,146,338 කින් සහ සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 2014 ණයහිමි වෙන්කිරීම් කර තිබීම හා ගෙවීම් කිරීමේදීද ණයහිමි බැරකර තිබීමත් 2015 ණයහිමියන් සඳහා ගෙවන ලද රු.47,732 ක මුදල සහ රු.69,868 ක් වටිනා තැන්පත් මුදල් ගෙවීම ජනල් සටහන් 29 මගින් සමුච්චිත අරමුදල් ගිණුම හර සහ විවිධ ණයහිමි ගිණුම බැර කර තිබීමත් නිසා ණයහිමි ගිණුම රු235,200 ක් වැඩියෙන්ද සමුච්චිත අරමුදල් ගිණුම රු.117,599 ක් අඩුවෙන්ද දැක්වුණි.

(ඈ) කැබ් රථයේ රක්ෂිත වටිනාකම ගිණුම්ගත කිරීම නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන් 02 මගින් රු.4,174,909 ක් මෝටර් රථ හා කරත්ත ගිණුම බැර කර ප්‍රාග්ධන ගිණුමට ආදායමින් දායකවීමේ ගිණුම හර කිරීම හේතුවෙන් රු.353,133 ක් එම ගිණුමේ අඩුවෙන් දක්වා තිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.82,367,036 ක්වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 10,615,690 ක්වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.32,151,625 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම්**

සභාවේ ලේකම් විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිගය |
|---|---|---|---|
| --------------- | ----------- | ------------ | ------------ |
| | රු. 000' | රු. 000' | රු. 000' |
| වරිපනම් හා බදු | 16,866 | 13,957 | 9,725 |
| බදුකුලී | 6,416 | 6,046 | 655 |
| බලපත්‍ර ගාස්තු | 511 | 511 | 71 |

2.2.2 **වරිපනම් බදු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වසර 1 ට වැඩි රු. 10,000 ඉක්මවන ලද වරිපනම් ඒකක 39 කින් අයවියයුතු හිග හිටි වරිපනම් බදු ශේෂය රු.2,145,343 ක් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට හිග හිටි වරිපනම් බදු ශේෂය රු.8,976,141 ක්ද, වසර 3-5 අතර හිග හිටි වරිපනම් බදු ශේෂය රු.4,352,065 ක්ද වසර 5 ට වැඩි හිග හිටි වරිපනම් බදු ශේෂය රු.757,642 ක්ද විය.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය අනුව 2008 සැප්තැම්බර් 05 දිනැති ගැසට් පත්‍රයේ දියුණු ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද උඩුගහ උප කාර්යාලයට හා පල්ලෙවෙල උප කාර්යාලවලට අයත් ප්‍රදේශ 23 ක හඳුනාගනු ලැබූ නව වරිපනම් ඒකක 8249 ක රජයේ විධිමත් තක්සේරුවක් ලබාගන්නා තෙක් සභාව විසින් තාවකාලික තක්සේරුවක් මත වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා වසර ගණනාවක සිට විශාල ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

(ඈ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය සහ 2008 අගෝස්තු 19 දිනැති පළාත් පාලන දෙපාර්තමේන්තුව (බ.ප.) පළාත් පාලන කොමසාරිස්ගේ අංක WP/LPD/10/2008 දරන චක්‍රලේඛයේ 4 (ආ) ඡේදය ප්‍රකාරව පළාත් පාලන ආයතන සඳහා උපරිම වරිපනම් බදු ප්‍රමාණයක් ලබා ගැනීම පිනිස හැකිතාක් දියුණු ගම් ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට හැකි බල ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කළ යුතු බව අවධාරණය කර ඇතත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.3 **කඩකුලී**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) මීරිගම උප කාර්යාලයට අයත් නව පොදු වෙළඳ පොළ අංක 15 දරන කඩ කාමරයෙන් 2015 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු කඩ කුලී රු.30,600 ක් වසර 2½ ක සිට හිඟව පැවති අතර ක්‍රීඩාංගනය ඉදිරිපිට අංක 13 කඩ කාමරයෙන් මාස 30 කට අදාළව 30,000 ක්ද හිඟව පැවතුණි.

(ආ) අංක 8,9,16 සහ 25 යන වෙළඳ සැල්වලට අදාළව රු.97,500 ක කඩ කුලී වසර 2 ට ආසන්න කාලයක සිට අයවියයුතුව තිබුණි.

2.2.4 **බලපත්‍ර ගාස්තු**

පල්ලෙවෙල උප කාර්යාලයේ 2014/2015 වෙළඳ බලපත්‍ර ලේඛනය අනුව 2012 හා 2013 වර්ෂ වෙනුවෙන් අයවියයුතු වෙළඳ බලපත්‍ර ලබාගත යුතු ස්ථාන 135 කින් රු.136,585 ක බලපත්‍ර ගාස්තුවක් අයවියයුතු වුවද, එම මුදල විගණිත දිනය වූ 2015 නොවැම්බර් 23 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 **සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු**

සභා බල ප්‍රදේශය තුළ ඇති සම්ප්‍රේෂණ කුළුණු සියල්ල හඳුනාගෙන 2009 අප්‍රේල් 17 දිනැති අංක 1597/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය පදනම් කර ගනිමින් අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගෙන එය ගැසට් කර ගනිමින් සභා බල ප්‍රදේශය සඳහා නියමිත පරිදි ගාස්තු අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

2.2.6 **පරිසර බලපත්‍ර**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 2 ක තුළ පරිසර බලපත්‍ර 19 ක් පමණක් ලබාදී තිබූ අතර, පරිසර බලපත්‍ර ලබාදීම් අවම මට්ටමක පැවතිණි. උප කාර්යාලවල බලපත්‍ර ලේඛන සමග සැසඳීමේදී පරිසර බලපත්‍ර ලබාගත යුතු කර්මාන්ත සඳහා බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ආ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/10 දරන ගැසට් නිවේදනයේ 23(අ) වගන්තිය ප්‍රකාර පරිසර බලපත්‍ර ආදායම් ලබා ගැනීමට ප්‍රාදේශීය සභාවට බලතල ලබාදී ඇති කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට 2015 ඔක්තෝබර් 30 දින දක්වා සභාව විසින් නිකුත් කරන ලද පරිසර බලපත්‍ර සමග උපකාර්යාලවල 2014, 2015 වර්ෂවල බලපත්‍ර හා කර්මාන්ත ලේඛන පරීක්ෂා කිරීමේදී 1980 අංක 47 දරන පරිසර පනත හා උක්ත ගැසට් නිවේදනය ප්‍රකාර කටයුතු නොකිරීම නිසා 2014 හා 2015 වර්ෂ සඳහා පරිසර බලපත්‍ර 307 ක් වෙනුවෙන් රු.1,252,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබුණි.

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

(අ) ප්‍රාදේශීය සභාව සතු රු.4,999,500 ක වටිනාකමකින් යුතු බැකෝ ලෝඩර යන්ත්‍රය (හොලන්ඩ්) වසර 02 ක පමණ කාලයක සිට නිශ්ක්‍රීයව පැවතුණි. දැනට අළුත්වැඩියාවක් හෝ වෙනත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව ප්‍රාදේශීය සභා පරිශ්‍රය තුළ දිරාපත් වෙමින් පවතින බව 2016 අප්‍රේල් 01 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) සභාව සතු රු.38,750 ක වටිනාකමකින් යුතු කුබෝටා අත්ට්‍රැක්ටරය, ට්‍රේලරයක් නොමැතිවීම හේතුවෙන් ඌන උපයෝජිතව වසරක පමණ කාලයක සිට සභා පරිශ්‍රය තුළ දිරාපත්වෙමින් පැවතින.

3.2 **<u>ආර්ථික නොවූ ගනුදෙනු</u>**

සභාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ මුරකරු තනතුරු 03 ක් පැවති අතර, පුරප්පාඩු නොතිබියදී 2015 වර්ෂයේදී සභාවේ ආරක්ෂක සේවාවක් පවත්වා ගෙන යාම වෙනුවෙන් පෞද්ගලික ආරක්ෂක සේවය සඳහා 2015 ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා රු. 975,658 ක් ගෙවීම් කර තිබුණි.

3.3 **<u>හඳුනාගත් අලාභ</u>**

2015 වර්ෂයේ පුස්තකාල 3ක සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව අස්ථානගතවී තිබූ වටිනාකම රු.49,588 ක් වූ පොත් 307 ක්ද, භාවිතයට ගත නොහැකි වටිනාකම රු.21,589 ක් වූ පොත් 302 ක්ද, තිබූ බවට නිරීක්ෂණය විය.

3.4 **<u>කොන්ත්‍රාත් පරිපාලනය</u>**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

3.4.1 **<u>ප්‍රමාද වූ ව්‍යාපෘති</u>**

සමාලෝචිත වර්ෂය තුළ ගිවිසුම්ගත කාලය ඉක්මවූ රු.5,476,798 ක් වටිනා කර්මාන්ත 13 ක්ද, ගිවිසුම්ගත නොවූ රු.1,213,325 ක් වටිනා කර්මාන්ත 4 ක්ද 2015 දෙසැම්බර් 31 දින වන විටද ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. සභාවේ මූල්‍ය අර්බුද හේතුවෙන් මෙම කර්මාන්ත ඉදිරි වසර තුළ ඉටු කිරීමට කටයුතු නොකර අවලංගු කිරීමට තීරණය කර ඇති බව ලේකම්වරයා 2016 මැයි 19 දින මා වෙත වාර්තා කර තිබුණි.

3.4.2 **<u>මීරිගම පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම</u>**

2013 වර්ෂයේදී නම්‍යශීලි අරමුදල යටතේ රුපියල් මිලියන 13.6 ක් අනුමත කරන ලද මීරිගම පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධ 2016 අප්‍රේල් 14 දින කරන ලද පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ 2013 ජුනි 26 දිනැති අංක 2/6/එන්ජී/2013 දරන නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) ගේ ලිපිය පරිදි 2013 නම්‍යශීලී අරමුදල යටතේ පුස්තකාලය ඉදිකිරීමට රු. මිලියන 13.6 ක් අනුමත කර තිබූ අතර, ව්‍යාපෘතිය 2013 වර්ෂය තුළදී අවසන් කිරීමට ක්‍රියා කළ යුතු බව හා ඉදිරියට අවිච්ඡේද නොවීමට කටයුතු කිරීම අත්‍යාවශ්‍ය බවද, 2013 නොවැම්බර් 30 දිනට පෙර ගිවිසුම් වලට එළඹිය යුතු බවද දන්වා තිබුණි. නමුත් මෙම ව්‍යාපෘතියට අදාලව 2013 වර්ෂය තුළදී සිදුකර තිබුණේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ (බස්නාහිර පළාත) පළාත් පාලන කොමසාරිස් විසින් පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් කොන්ත්‍රාත්කරු තෝරාගෙන රු.16,661,400 ක (එකතු කළ අගය මත බදු රහිත) මුදලකට 2013 දෙසැම්බර් 30 දින ගිවිසුමකට එළඹීම දක්වා කටයුතු පමණි.

(ii) උක්ත ඉදිකිරීමට අදාළ භූමිය ඉතා දුර්වල පස් තට්ටුවකින් යුක්ත බවත් යෝග්‍යතාව නැවත සළකා බැලියයුතු බවත් ප්‍රාදේශීය ඉංජිනේරු විසින් පළාත් පාලන කොමසාරිස් වෙත 2014 මැයි 02 දින දන්වා තිබුණි. ඒ අනුව 2014 ජුනි 19 දිනැති සීඑස්ඕ/ඊඑන්ජී/1/8/15 දරන ප්‍රධාන ලේකම් කාර්යාලය බස්නාහිර පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) ගේ ලිපිය පරිදි මේ සඳහා රු.2,000,000 ක අතිරේක මුදලක් වැයවන බව දන්වා තිබුණි.

(iii) නව සංශෝධිත පිරිවැය ඇස්තමේන්තු මුදල රු.27,000,000 ක් බවද 2014 වර්ෂයේ මෙහි දෙවන අදියර සඳහා රු.9,000,000 ක් මුදලක් අනුමත කර තිබුණු අතර, මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී නිමකළ යුතු බවද දන්වා තිබුණි..

(iv) පුස්තකාල ගොඩනැගිල්ල සඳහා ගිවිසුම්ගත මුදල් රු.21,172,789 ක්වූ අතර, 2016 පෙබරවාරි 16 දින වන විට කොන්ත්‍රාත්කරුට රු.20,538,865 ක් ගෙවීම් කර තිබුණි. 2015 වර්ෂයේදී ස්ථාවර වත්කම් උපලේඛනය අනුව I වන හා II වන අදියර තුළදී පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමට රු.26,215,965 ක් වැය වී ඇති බව පෙන්නුම් කර තිබුණද, උක්ත වියදම හැර අනෙකුත් දරන ලද වියදම් වටිනාකම පිළිබඳව විගණනයට තොරතුරු ඉදිරිපත් නොවිය.

## 3.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ජේ.සී.බී. බැකෝ යන්ත්‍රය 2014 ජනවාරි 16 සිට 2016 අප්‍රේල් 01 දින විගණිත දින දක්වා අක්‍රිය තත්ත්වයේ පැවති අතර අවස්ථා කීපයකදී අවිධිමත් ලෙස අලුත්වැඩියාවට යොමුකර තිබුණි. නිසි පරිදි අලුත්වැඩියාවන් කර ගැනීමට කළමනාකරණයට නොහැකි වී තිබුණි.මෙම යන්ත්‍රය වසර 1½ කට ආසන්න කාලයක් අළුත්වැඩියා නොකර ගරාජ්වල තබා සභාවේ කටයුතු සඳහා 2014, 2015 වසර වලදී පිළිවෙලින් රු.751,750 ක් හා රු.1,565,520 ක් ලෙස එකතුව රු.2,317,270 ක කුලී මුදලක් ගෙවා කුලී පදනමට ජේසීබී යන්ත්‍ර ලබා ගෙන තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව සතුව පරිත්‍යාග ලෙස ලද ජල බවුසරයක්, බැකෝ යන්ත්‍ර, මාර්ග තලනය (ටොන්08) හා මෝටර් ග්‍රේඩරයක් සහ වැඩ කම්කරුවන් 44 දෙනෙකුද, තාක්ෂණික නිලධාරීන් 05 දෙනෙකුද සිටියද, එම සම්පත් උපයෝජනය කර ගැනීමකින් තොරව 2015 වර්ෂය තුළදී රු.6,027,270 ක් වටිනා සහා කර්මාන්ත 21 ක් බාහිර කොන්ත්‍රාත්කරුවන් ලවා සිදුකරවාගෙන තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්ය නිමවූ වහාම අත්තිකාරම් මුදල් පියවීම කළයුතු වුවත් සභාව විසින් ලබාදුන් අත්තිකාරම් වසර 5 ට වැඩි ශේෂ 101 කට අදාළව රු.6,108,841 ක්ද, වසර 3 ට වැඩි ශේෂ 26 කට අදාළව රු.158,181 ක මුදලක්ද වසර 1 ට වැඩි ශේෂ 4 කට අදාළ රු.130,000 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

## 3.6 ඉඩම් අනුබෙදීම

2015 මාර්තු මස වෙන්දේසිකළ දන්වලවත්ත නැතහොත් ආඳාගලවත්ත නමැති ඉඩම අනුකොටස් බෙදීම සඳහා රු.601,447 ක බදු මුදලක් අයකර තිබුණි. මෙහිදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) මෙම ඉඩමට අදාල මුල් ඔප්පුව සහ අංක 6170 ඒ දරණ සැලැස්ම විගණනයට ඉදිරිපත් නොවිය.

(ii) රු. 601,447 ක්වූ බදු මුදල් අයකිරීම පිළිබඳ උපලේඛනය විගණනයට ඉදිරිපත් නොවිය.

(iii) 2015 මාර්තු 24 දිනැති වේවැල්දෙනිය උප කාර්යාලයේ තාක්ෂණික නිලධාරියාගේ වාර්තාව අනුව ඉඩම සංවර්ධනය කිරීමට අදාල කොන්දේසි 7 ක් ඉටුකිරීමෙන් පසු බිම්කට්ටි විකිණීම අනුමත කලයුතු බව සඳහන්ව ඇතත්, එම කොන්දේසි ඉටුකර නොතිබුණි.

(iv) තාක්ෂණික නිලධාරි වාර්තාව අනුව ඉඩමෙන් පොදු පහසුකම් යටතේ සභාවට පවරාගත යුතු පර්චස් 94 ක ඉඩම සභාවට පවරා ගැනීමට අදාළ කටයුතු 2016 අප්‍රේල් 04 දින විටත් ඉටුකර නොතිබුණි.

(v) සැලසුම් කමිටුවේ අනුමැතිය විගණනයට ඉදිරිපත් නොවීය.

3.7 **සන අපද්‍රව්‍ය කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණයකරනු ලැබේ.

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය නව ස්ථානයක ස්ථානගත කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.5,000,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද, අදාළ අරමුණට එම ප්‍රතිපාදන යොදවා නොතිබුණි.

(ආ) සභාව විසින් දෛනිකව කසළ ටොන් 08 ක් පමණ එකතු කරන අතර තේරීම, පෙරළීම, ෆයිල් සැකසීම යනාදී කාර්යයන් ඉටුකර ගැනීමට ප්‍රමාණවත් ඉඩ පහසුකම් හා යන්ත්‍ර සූත්‍ර ( පැලට්, බ්ලොක් කැට් යන්ත්‍ර යනාදී) කොම්පොස්ට් අංගනය තුළ නොමැති බව නිරීක්ෂණය විය. සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂයේ ප්‍රතිපාදිත මුදලින් රු.792,284 ක් දෙසැම්බර් 31 දින වන විටත් ඉතිරිව තිබියදී මෙම ව්‍යාපෘතියෙහි ඵලදායිතාවය නංවා ගැනීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

3.8 **පාරිසරික ගැටළු**

පුද්ගලික සමාගමක් මගින් නාඹුළුව, පස්යාල ප්‍රදේශයේ ප්‍රධාන මාර්ගයට මායිම් වූ ඉඩමක ඉදිකර ඇති අපද්‍රව්‍ය පිලිස්සුම් ඒකකය මගින් පිටවන සෞඛ්‍යයට අහිතකර පොලිතින් දුම පිළිබඳව ප්‍රදේශවාසීන් මාස 06 ක පමණ සිට ප්‍රාදේශීය සභාව දැනුවත් කර තිබුණද, 2016 අප්‍රේල් 05 විගණිත දින වන විටත් මෙම පරිසර ගැටළුව පිළිබඳව අවසන් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. 2015 ඔක්තෝබර් 19 දින මධ්‍යම පරිසර අධිකාරියට මේ පිළිබඳව දන්වා යවා ඇති බව 2016 මැයි මාසයේදී ලේකම්වරයා මා වෙත වාර්තා කර තිබුණි.

4. **පද්ධති හා පාලනය**

පහත සඳහන් පද්ධතා හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණනය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය